නල්ලූර් ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 11 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට නල්ලූර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
--------------------------------

ලැබිය යුතු ගිණුම්
------------------

තිරුනෙල්වේලි වෙළඳ පොළ ගොඩනැගිල්ල යළි ඉදිකිරීම සඳහා වසර පහකට අධික කාලයකට පෙර කොන්ත්‍රාත්කරුවෙකුට ගෙවන ලද රු.151,437 ක් අත්තිකාරම් අදාළ වැඩ නිමකර තිබූ නමුත්, මේ දක්වාම නිරවුල් කර නොතිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිකම
--------------------------------------

විගණනයට තොරතුරු ඉදිරිපත් නොකිරීම
-------------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ සමීක්ෂණ මණ්ඩලයට පුස්තකාල පොත් 288 ක් භෞතික පරීක්‍ෂාව සඳහා ඉදිරිපත් කර නොතිබූ බැවින් ඒවා විගණනයේදී සතුටුදායක අන්දමින් සත්‍යනිරීක්‍ෂණය කිරීමට හෝ පිළිගත නොහැකි විය.

1.3.4 අනුකූල නොවීම්

--------------------

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-------------------------------------------------------------------

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | -------------------------------- | ------------ | --------------------- |
| | | රු. | |
| (අ) | 1987 අංක 15 දක්වා ප්‍රාදේශීය සභා පනත<br>158(1) වගන්තිය | 6,879,629 | දේපළ මත හිඟ තක්සේරු බදු ගෙවීම පැහැරහැරි පුද්ගලයන්ට සභා ලේකම් විසින් වරෙන්තුවක් නිකුත් කර නොතිබුණි. |
| (ආ) | උතුරු පළාත් මුදල් චක්‍රලේඛය<br>2017 මාර්තු 17 දිනැති අංක පීඑෆ/01/2017 | | පරිපාලනමය වශයෙන් බලතල පැවරීම් පරිදි මුදල් ලබාගැනීම සහ බඩු ගබඩා භාරකාරිත්වය සඳහා වගකීම පැවරණු නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>මුදල් රෙගුලාසි 571 | 2,451,654 | වසර 02 කට අධික කාලයක් පුරා කොන්ත්‍රාත්කරුවන්ගේ තැන්පතු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඈ) | රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ<br>2008 ජුනි 26 දිනැති අංක 12/2008 | | එක් එක් මාසය සඳහා වූ වාහන දෛනික ධාවන සටහන් පසු මාසයේ 15 දින හෝ ඊට පෙර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි |

1.3.4.2 බදු අවශ්‍යතාවන්ට අනුකූල නොවීම

---------------------------------------

නිලධාරීන් තිදෙනෙකුගෙන් අයකර ගත් එකතුව රු.5,922 ක්වූ උපයන විට ගෙවීමේ බදු 2013 සැප්තැම්බර් 01 දිනැති අංකඑස්ඊසී/2013/07 දිනැති චක්‍රලේඛයට අනුකූලව දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීම සඳහා පසුගිය වසර තිස්සේම ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 110,771,569 ක් වූ අතර, ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ පුනරාවර්ත වියදම ඉක්මවූ ආදායම රු.83,423,712 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන් තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 2,615,000 | 2,535,003 | 1,600,466 | 6,879,629 | 2,725,000 | 3,005,995 | 2,599,792 | 6,899,457 |
| (ii) කුලී | 28,585,000 | - | 30,103,144 | - | 25,288,600 | - | 21,454,260 | - |
| (iii)බලපත්‍ර ගාස්තු | 3,248,700 | - | 3,442,528 | - | 2,826,000 | - | 3,450,048 | - |
| (iv)වෙනත් ආදායම් | 42,812,0007 | - | 89,464,080 | 215,634,585 | 43,392,000 | - | 63,403,076 | 193,861,477 |
| එකතුව | 772,260,700 | 2,535,003 | 125,610,218 | 222,514,314 | 74,231,600 | 3,005,975 | 90,907,176 | 200,760,934 |

#### 2.2.2 වරිපනම් හා බදු

-----------------

එකතුව රු.6,879,629 ක්වූ හිඟ වරිපනම් හා බදු අයකර ගැනීම සඳහා පසුගිය වසර 01 සිට වසර 05 දක්වා කාලය තුළ සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

#### 2.2.3 කුලී මුදල්

----------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) එකතුව රු.146,916 ක්වූ හිඟ කඩ කාමර බදු මුදල් අයකර ගැනීම සඳහා පසුගිය වසර 02 සිට වසර 05 දක්වා කාලය තුළ සභාවවිසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) එකතුව රු.813,324 ක්වූ හිඟ වෙළඳ පොළ කඩ කාමර කුලි මුදල් අයකර ගැනීම සඳහා පසුගිය වසර 02 සිට වසර 05 දක්වා කාලය තුළ සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

#### 2.2.4 බලපත්‍ර ගාස්තු

-----------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ එකතුව රු.2,000 ක්වූ වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීම සඳහා පසුගිය වසර තුළ සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.2.5 මුද්දර ගාස්තු

------------------

රු.203,870,302 ක්වූ මුද්දර ගාස්තු උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙතින් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා අවසරය ලබා ගැනීමෙන් තොරව ඉදිකර තිබූ විදුලි සංදේශ කුළුණු 03 ක් සම්බන්ධයෙන් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) තිරුනෙල්වේලි සාප්පු සංකීර්ණය සහ කොකුවිල් මහජන පුස්තකාලය යළි ඉදිකිරීමේ කර්මාන්ත සමාලෝචිත වර්ෂයේ සැලසුම් කළ පරිදි නිම කිරීම සඳහා සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) එකතු කළ අගය මත වූ බදු සඳහා ලියාපදිංචි වීමට කටයුතු නොකළ ,කොන්ත්‍රාත්කරුවකු විසින් නිමකළ කර්මාන්ත වලට අදාළව එකතුව රු.417,345ක් වූ එකතු කළ අගය මත බදු ආදායමට බැර කිරීමෙන් තොරව සභාව විසින් පසු ගිය වසර 05ක් තිස්සේ පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

----------------------------

3.2.1 අක්‍රිය වත්කම්

------------------

රු.5,354,000 ක පිරිවැයකට මිලටගත් කරුන්කන්පුලම් ඉඩම ප්‍රවාහන පහසුකම් නොමැතිකම හේතුවෙන් පසුගිය වසර 6 පුරාම අක්‍රියව පැවතිණි.

3.2.2 වත්කම් භාරදීමට අසමත්වීම

--------------------------------

සභාව විසින් භාවිත ට්‍රැක්ටර් හා ට්‍රේලර් වර්ග පහක් සභාවට අයත්ව නොතිබුණි.

4. වගකීම්භාරය සහ යහපාලනය

--------------------------------

4.1 අයවැය පාලනය

------------------

අයවැයගත ආදායම හා තත්‍ය ආදායම අතර රු.14,356 සිට රු.45,167,671 දක්වා හෙවත් සියයට 0.55 සිට සියයට 125 දක්වා සහ අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර රු.2,081 සිට රු.4,261,824 දක්වා හෙවත් සියයට 1.54 සිට සියයට 6.73 දක්වා වූ පරාසවල විචලන නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

-----------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධති | අඩුපාඩු |
| --- | --- |
| ගිණුම්කරණය | මිණුම් පත්‍රිකා ලේඛනය සහ ඉඩම් විකුණුම්මත බදු ලේඛනය නඩත්තු කිරීමට අසමත්වීම |